


# ස්වයං-සාම්පල එකතු කිරීම හා ගැබ් ගෙල පරීක්ෂාව - දත්ත පත්‍රිකාව

***සුව සේවා සපයන්නෙකු පමණක් උපදේශක සාකච්ඡාවක් අතරතුර දී සැපයිය යුතුය.***

ගැබ් ගෙල පිළිකාවලින් ආරක්ෂා වීම සඳහා සුදුසුතම මග නිතිපතා පරීක්ෂණ වලට සහභාගී වීමයි. නිතිපතා කෙරෙන ගැබ් ගෙල පරීක්ෂණ ඉතා වැදගත් ය. ඔස්ට්‍රේලියාවේ සෑම වසරකම කාන්තාවන් 800 ක් පමණ ගැබ් ගෙල පිළිකා රෝගීන් ලෙස හඳුනා ගනු ලබන අතර ඉන් 80% පමණ පරීක්ෂණයකට කිසි දින භාජනය නොවුනු හෝ පරීක්ෂණයකට නියමාකාරයෙන් භාජනය නොවුනු අය වෙති.

## ගැබ් ගෙල පරීක්ෂාවන් කර ගත යුත්තේ කවුරුන්ද?

මානව පැපිලෝමා වෛරසය (HPV) සඳහා එන්නත් ලබාගත් අය ඇතුලු අවුරුදු 25-74 දක්වා ලිංගිකව සක්‍රීය කාන්තාවන් සෑම අවුරුදු පහකටම වරක් ගැබ් ගෙල පරීක්ෂාව කරගත යුතුය.

## ස්වයං-එකතු කර ගැනීම යනු කුමක්ද?

ගැබ් ගෙල පරීක්ෂාව සඳහා තමා විසින්ම තම සාම්පලය ලබාගන්නා විට එය ස්වයං-එකතු කිරීමක් ලෙස හැඳින් වෙයි. දැනට ගැබ් ගෙල පරීක්ෂණයක් සඳහා කල් ඉක්ම වූ අය හෝ කිසිදිනක පරීක්ෂනයකට භාජනය නොවුන කාන්තාවන් සඳහා මෙම අවස්ථාව ලබා දේ.

## මා ස්වයං-එකතු කිරීමට සුදුසුකම් ලබයිද?

සියලුම කාන්තාවන්ට තම සාම්පල තමුන්ම එකතු කිරීම නිර්දේශ නොකෙරේ. ඔබට කුමන සාම්පල එකතු කිරීමේ ක්‍රමය සුදුසුද යන්න ඔබේ වෛද්‍යවරයා ගැබ් ගෙල පරීක්ෂණය හා ස්වයං-එකතු කිරීම පිළිබඳ සාකච්ඡා කරන අතරතුර පවසනු ඇත.

ඔබ අවුරුදු 30 ක් හෝ ඊට වඩා වයසැති නම් ස්වයං-එකතු කිරීම විකල්පයක් විය හැකි අතර සහ පහත එක් වරගයකට අයත් විය යුතුය:

- ගැබ් ගෙල පරීක්ෂාවකට (හෝ පැප් පරීක්ෂාවකට) කිසිදා භාජනය නොවූ අයකු හෝ
- ගැබ් ගෙල පරීක්ෂාව සඳහා අවුරුදු දෙකකට වඩා කල්ගත වූ අයකු.

ඔබ ගර්භනී නම්, හෝ ගර්භනී යැයි සිතන්නේ නම් හෝ අසාමාන්‍ය රුධිර වහනයක්, වේදනාවක් හෝ දියරමය ස්‍රාවයක් අත්දකී නම් හෝ එවිට, ස්වයං-එකතු කිරීම නොසුදුසු වේ.

ඔබේ අවසාන පරීක්ෂණය සිදුකලේ කවදාද යන්න අපහැදිලි නම් ඔබේ වෛද්‍යවරයා හා කතා කරන්න.

## මගේ සාම්පලය ම විසින්ම එකතු කරන්නේ කෙසේද?

ස්වයං-එකතු කිරීමේ මිනුම් දඬු සැපිරීමට ඔබ සමත් වන්නේ නම් හා එය හොඳම විකල්පය බව ඔබ තීරණය කරයි නම්, ඔබේ වෛද්‍යවරයා සාම්පලය එකතුකරන්නේ කෙසේද යන්න සඳහා උපදෙස් සමග ස්වයං-එකතු කිරීම සඳහා උපකරණයක් ඔබ වෙත ලබාදෙනු ඇත. මෙම සාම්පලය වෛද්‍ය හෝ සුවසේවා මධ්‍යස්ථානයකදී කල යුතු වේ. සාම්පලය ලබාගැනීම සඳහා පුද්ගලික ස්ථානයක් වෛද්‍යවරයා ඔබ වෙත සපයනු ඇත.

## ගැබ් ගෙල පිළිකා මර්දනය කිරීමෙහි ලා ස්වයං-එකතු කිරීමකින් ලද සාම්පලයක් වෛද්‍යවරයා විසින් ලබාගන්නා ලද සාම්පලයක් මෙන්ම සාර්ථක විය හැකිද?

ස්වයං-එකතු කිරීමකදී ලද සාම්පලයේ ඇත්තේ යෝනි මාර්ගික සෛල පමණක් (ගැබ් ගෙල සෛල නොව) වන අතර HPV සඳහා පමණක් පරීක්ෂා කල හැකි වේ.

වෛද්‍යවරයෙකු විසින් ලබාගත් සාම්පලයක ගැබ් ගෙල සෛලද අඩංගු වේ. ගැබ් ගෙල සෛල HPV සඳහා පරීක්ෂා කල හැකි වන අතර HPV එහි ඇත්නම් අසාමාන්‍ය ගැබ් ගෙල සෛල ඇතිදැයි යන්න සොයා බැලීමට ඒ සාම්පලයම යොදා ගත හැක. වෛද්‍යවරයකු ලබාගන්නා සාම්පලය වඩාත්ම ඵලදායී වේ.

ඔබ විසින් ස්වයං-එකතුවකින් ලබාගත් සාම්පලයක් තුල HPV හමුවුන හොත් ඔබ වැඩිදුර පරීක්ෂණ සඳහා විශේෂඥ වෛද්‍යවරයෙකුට යොමු කල හැකි වනු ඇති හෝ වෛද්‍යවරයා වෙත නැවත ගොස් වෛද්‍යවරයා ලවා සාම්පලයක් ලබාගැනීමට සිදුවනු ඇත. මෙම සාම්පලයෙහි ගැබ් ගෙලින් ලබාගත් සෛල (ගැබ් ගෙල සෛල) අඩංගු වන අතර ගැබ් ගෙල පිළිකා දක්වා වර්ධනය විය හැකි සෛල හඳුනා ගැනීමට පරීක්ෂා කෙරෙනු ඇත. සෛලවල වෙනසක් දක්නට ලැබුනහොත් මීලග පියවර පිළිබඳව ඔබේ වෛද්‍යවරයා ඔබ සමග සාකච්ඡා කරනු ඇත.

**ඔබ අස්වාභාවික යෝනි මාර්ගික රුධිර වහනයක්, වේදනාවක් හෝ දියරමය ස්‍රාවයක් අත්දකී නම් වෛද්‍යවරයකු මුණගැසීම ඉතා වැදගත් වේ.**

ගැබ් ගෙල පරීක්ෂාව පිළිබඳ වැඩිදුර තොරතුරු අවශ්‍ය නම් කරුණාකර ඔබේ වෛද්‍යවරයා මුණගැසෙන්න. අපේ වෙබ් අඩවිය වන **www.cancerscreening.gov.au/cervical** වෙත පිවිසෙන්න. නැතිනම් අංක **13 15 56** ට කතාකල හැක.

ජාතික පිළිකා පරීක්ෂණ ලේඛණයේ ඔබේ තොරතුරු යාවත්කාලීන කිරීමට හෝ ඉන් ඉවත් කිරීමට අංක **1800 627 701** අමතන්න.

ජාතික ගැබ් ගෙල පරීක්ෂණ වැඩසටහන (National Cervical Screening Program) ඔස්ට්‍රේලියානු ප්‍රාන්ත හා සන්තක ප්‍රදේශ එකතුව දියත් කල වැඩසටහනකි.

ඉංග්‍රීසියෙන් කතාකිරීමට අපහසු නම් හා උපකාර අවශ්‍ය නම් භාෂා පරිවර්තන හෝ භාෂණ පරිවර්තන සේවය අංක **13 14 50** මගින් අමතන්න. මේ සඳහා ප්‍රාදේශීය දුරකතන ඇමතුම් ගාස්තුවට සමාන මුදලක් වැයවෙනු ඇත.

Australian Government